# ආර්ථික විද්‍යාව

## පලමු පාඩම

Video - 01

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

## අවශ්‍යතා යනු

- මිනිසෙක්ට ජීවත් වීම සඳහා අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු දෑ අවශ්‍යතා ලෙස හඳුන්වයි

- අවශ්‍යතා භෞතික අවශ්‍යතා හා මානසික අවශ්‍යතා ලෙස වර්ග දෙකකි

- භාණ්ඩ හා සේවා පරිභෝජනය මගින් සෘජුවම සපුරාගත හැකි අවශ්‍යතා භෞතික අවශ්‍යතා ලෙස හැඳින්වේ
  - නිදසුන් - ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම්

- භාණ්ඩ හා සේවා පරිභෝජනය මගින් සෘජුවම සපුරාගත නොහැකි දෑ මානසික අවශ්‍යතා වේ
  - නිදසුන් - අධ්‍යාත්මික සංවර්ධනය, ආදරය, කරුණාව

## මිනිසුන්ගේ ආර්ථික හැසිරීම යනු

- මිනිසුන් සමාජයේ පවතින සීමිත සම්පත් යොදා ගෙන භෞතික අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීමට සිදුකරන ක්‍රියාකාරකම් හා හැසිරීම් ආර්ථික හැසිරීම් ලෙස හඳුන්වයි

    ○ නිදසුන් - භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය

## ආර්ථික විද්‍යාව විද්‍යාවක් වීමට හේතුව

- විධාකාර වූ ආර්ථික විද්‍යා න්‍යාය හා මූලධර්ම විද්‍යාත්මක ක්‍රමවේද අනුව ගොඩනැගී ඇති බැවිනි

# ආර්ථික විද්‍යාව සමාජීය විද්‍යාවක් වීමට හේතු

- ආර්ථික විද්‍යාව මගින් මිනිසුන්ගේ ආර්ථික හැසිරීම් විග්‍රහ කිරීම.
- ගොඩනැගෙන ආර්ථික න්‍යාය පර්යේෂණාගාර තුළ සනාථ කළ නොහැකි වීම.
- මිනිස් හැසිරීම් කාලය ප්‍රදේශයේ සමාජ පරිසරය වැනි සාධක කෙරෙහි සංවේදී වන බැවින් ස්වභාවික විද්‍යාවන්හි දී එළඹෙන ආකාරයේ දැඩි ස්වරූපයෙන් න්‍යායන් ආර්ථික විද්‍යාව වැනි සමාජීය විද්‍යාවන් හි ගොඩනැගිය නොහැකි වීම.

# ආර්ථික විද්‍යාව යනු

භාණ්ඩ හා සේවා අත්පත්කරගැනීමට මිනිසුන් තුළ ඇති අසීමිත ආශාවන් සහ ඊට සාපේක්ෂව එම භාණ්ඩ හා සේවා නිපදවීමට අවශ්‍ය සම්පත් ප්‍රමාණය සීමිත බව අතර ගැටුම සමථයකට පත්කර ගැනීමට මිනිසුන් කටයුතු කරන ආකාරය ආර්ථික විද්‍යාවෙන් අධ්‍යයනය කෙරේ.

# ආර්ථික විද්‍යාව ඉගෙනීමේ වැදගත්කම

- රාජ්‍ය පාලනයේදී වැදගත් වීම.
- සාර්ථක පුරවැසියෙකු ලෙස කටයුතු කිරීමට වැදගත් වේ.
- ආර්ථික සංසිද්ධියෙන් වඩාත් හොඳින් තේරුම් ගැනීමට වැදගත් වේ.
- ආයෝජකයන්ට පාරිභෝගිකයන්ට සහ නිෂ්පාදකයන්ට කාර්යක්ශම තීරණ ගැනීමේදී වැදගත් වීම.
- ඡන්දදායකයින්ට සිය ඡන්දය භාවිතා කිරීමේ දී වැදගත් වේ.
- පාසල් ශිෂ්‍යයන්ට තාර්කිකව සිතා තීරණ ගැනීමට වැදගත් වීම පුද්ගලයකුට වඩාත් හොඳ රැකියාවක් තෝරා ගැනීමේදී වැදගත් වේ.

# සූක්ෂම ආර්ථික විද්‍යාව යනු

ආර්ථිකයක සමන් වී ඇති එක් එක් අංශ ආයතන පුද්ගලයන් සහ ආර්ථික විචල්‍ය ආදී කුඩා ඒකක වෙන් වෙන් වශයෙන් ගෙන ඒවායේ හැසිරීම් අධ්‍යයනය කිරීම සූක්ෂම ආර්ථික විද්‍යාව ලෙස හැඳිනවේ.

## නිදසුන්

යම් භාණ්ඩයක ඉල්ලුම සැපයුම මිල

ආයතනයක පිරිවැය

එක් එක් භාණ්ඩ වල වෙළඳපළ ක්‍රියාකාරිත්වය

වෙළඳපොලේ පාරිභෝගික හැසිරීම

ව්‍යාපාර ආයතනයක වෙළඳපළ ක්‍රියාකාරිත්වය

හිඟකම

ආන්තික පිරිවැය

විකල්ප අතර තේරීම

# සාර්ව ආර්ථික විද්‍යාව යනු

එක් එක් අංශවල සමස්ත ක්‍රියාකාරිත්වයත් එම ක්‍රියාකාරිත්වය තීරණය කරන සාධක එම ක්‍රියාකාරිත්වය තුළින් පැන නගින ප්‍රශ්න සාර්ව ආර්ථික විද්‍යාවේ දී අධ්‍යයනය කෙරේ

නිදසුන්
සමස්ත මිල මට්ටම
සමස්ත ආදායම් මට්ටම
ආර්ථික උත්පාත හා අවපාත
උද්ධමනය
සේවානියුක්තිය
විරැකියා මට්ටම
ආයෝජන
ආර්ථික වෘරධිය
ආර්ථික පසුබෑසීම
ගෙවුම් ශේෂය
විනිමය අනුපාතික
මුදල් සැපයුම
අපනයන ආනයන

# යථානුරූපී ප්‍රකාශ යනු

කුමක්ද, කුමක් වූයේද, කුමක් වනු ඇත්ද ආදී ප්‍රශ්න වලට පිළිතුරු දීම සඳහා යොමු වූ සහ ප්‍රකාශය නිර්වද්‍යතාවය පරීක්ෂාවට ලක් කළ හැකි ප්‍රකාශ ථානුරූපී ප්‍රකාශ වේ.

මෙහි විද්‍යාත්මක බවක් දැකිය හැක.

න්‍යායාත්මක බවක් දැකිය හැක.

බොහෝ ආර්ථික න්‍යායාන් යථානුරූපි ප්‍රකාශ මත ගොඩනැගේ.

දැඩි ලෙස විෂයානුබද්ධ වේ.

විචල්‍යයක හැසිරීම හෙවත් ආර්ථික සංසිද්ධීන් පැහැදිලි කිරීමට මෙය යොදා ගැනේ.

## නිදසුන්

මුදල් සැපයුම මිල මට්ටම අතර අනුලෝම සම්බන්ධතාවයක් පවතී

ඉල්ලුම් ප්‍රමාණයත් මිලත් අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතී

2019 වර්ෂයේ සේවා වියුක්තිය පහළ බැස ඇත

ශ්‍රී ලංකාවේ ලංකාවේ ජනගහන වර්ධනය සියයට එකයි

## අභිමතානුරූපි ප්‍රකාශ යනු

සමාජය තුළ පැවැතිය යුත්තේ කුමක්ද, සිදුවිය යුත්තේ කුමක්ද යන්න පිළිබඳව ඉදිරිපත් වී ඇති ප්‍රකාශ අභිමතානුරූපි ප්‍රකාශ වේ.
අභිමතානුරූපි ප්‍රකාශ පුද්ගල අදහස් විශ්වාස සහ සාරධර්ම ආදිය මත රඳා පවතී.

සැබෑ ලොව දත්ත ඇසුරෙන් විෂයානුබද්ධව අභිමතානුරූපී ප්‍රකාශවල සත්‍ය තාවය ප්‍රකාශ කිරීම අපහසුය.
ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ විග්‍රහයන් සඳහා මෙම ප්‍රකාශ වැදගත් වේ.

නිදසුන්

සේවකයන්ගේ වැටුප් වැඩි කළ යුතුය.
සංවර්ධනයට විදේශ ආධාර ලබාගත යුතුය.
පුරවැසියන්ට නොමිලේ ප්‍රතිකාර ලබාදිය යුතුය.
සෑම පුද්ගලයෙකුටම සමාන ආදායමක් ලැබිය යුතුය.

# ආර්ථික විද්‍යාව

## පළමු පාඩම

Video - 02


දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# නිෂ්පාදන සාධක

**නිෂ්පාදන (භාණ්ඩ හා සේවා) බිහි කිරීමට යොදාගනු ලබන දෑ නිෂ්පාදන සම්පත්වේ.**

**මේවා කොටස් 4 කී**

- භූමිය
- ප්‍රාග්ධනය
- ශ්‍රමය
- ව්‍යවසායකත්වය



# භූමිය

ස්භාවධර්මයා දායාද කොට ඇති ඵලදායිතාවයෙන් යුක්තව නිෂ්පාදනයට යොදවා ගත හැකි ස්වාභාවික සම්පත් භූමිය ලෙස හැඳින්වේ.

උදා - වනාන්තර, ඛනිජ සම්පත් ආකරය, ඇළදොළ, වන සතුන් ගංගා, වායුගෝලයේ.

වැනි පොළොව මතුපිට මෙන්ම පොලව අභ්‍යන්තරයේ ඇති සියලුම සම්පත් භූමියට අයත් වේ.

## භූමියෙහි ලක්ෂණ

- ස්භාවධර්මයේ දායාදයක් වීම
- සැපයුම අනම්‍ය වීම
- සංචලනතාවයෙන් යුක්තනොවීම
- ඵලදායිතාවය වර්ධනය කළ හැකි වීම
- ඒකාකාරී නොවීම (පිහිටීම, දේශගුණය, ඛනිජ සම්පත් ජලසම්පත් )
- භූමියට කරන ගෙවීම බදුකුලිය

## ශ්‍රමය

හාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදා ගන්නා මිනිසෙකුගේ කායික හා මානසික වෙහෙස ශ්‍රමය ලෙස හඳුන්වයි.

## ශ්‍රමයේ ලක්ෂණ

- සජීවී සාධකයක් වීම.
- සංචලනය කළ හැකිවීම.
- සමජාතිය නොවීම.
- අධ්‍යාපනය සහ පුහුණුව තුළින් ශ්‍රමයේ ඵලදායිතාව වර්ධනය කළ හැකි වීම. තීරණ ගැනීම හා සංවිධානය වීමට හැකිවීම.
- ශ්‍රමයට කරන ගෙවීම වැටුප් වේ.

## ශ්‍රමයේ ප්‍රමාණය තීරණය වීම කෙරෙහි බලපාන සාධක

- ජනගහනය ප්‍රමාණය හා වයස් ව්‍යුහය.
- ජනසංඛ්‍යාවේ ප්‍රමාණය.
- සෞඛ්‍ය තත්ත්වය.
- ජනසංඛ්‍යාවේ අධ්‍යාපන මට්ටම හා නිපුණතාවය

# ආර්ථික විද්‍යාව

## පළමු පාඩම

Video - 03

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# ප්‍රාග්ධනය

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියට මිනිසා විසින් නිර්මාණය කරන ලද ආධාරක ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ.

උදා - ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර, වරාය, මහාමාර්ග, ඇළවේලි, ගුවන්තොටුපල

## ප්‍රාග්ධනයේ විශේෂ ලක්ෂණ

- මිනිසාගේ නිර්මාණයක් වීම.
- ප්‍රාග්ධනය මූර්ත සංකල්පයකි / තොග සංකල්පයකි.
- ඵලදායිතාවයෙන් යුක්ත වීම.
- නැවත නැවත නිෂ්පාදනයට යොදා ගත හැකි වීම.
- ක්ෂය වීමට ලක් වීම.
- ප්‍රාග්ධනයට ප්‍රතිලාභය පොලිය ලෙස සැලකීම.

# ප්‍රග්ධනයේ විවිධ ස්වරූප

ප්‍රාග්ධනයට සම්පත්වල විවිධත්වය හා ඒවායේ භාවිතය තීරණය වන්නේ ඒ ඒ රටවල පවතින තාක්ෂණික මට්ටම් අනුව ඒ අනුව ප්‍රාග්ධනය විවිධ ස්වරූප ගණුලැබේ.

- ස්ථාවර ප්‍රාග්ධනය (මූර්ත ප්‍රාග්ධනය/භෞතික ප්‍රාග්ධනය)
- කාරක ප්‍රාග්ධනය (සංසරණ ප්‍රාග්ධනය/ තොග/ පරිලේඛන)
- ආර්ථික පොදු කාර්ය ප්‍රාග්ධනය
- සමාජ පොදු කාර්ය ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- ස්වභාවික ප්‍රාග්ධනය
- සමාජ ප්‍රාග්ධනය

# ස්ථාවර ප්‍රාග්ධනය (මූර්ත ප්‍රාග්ධනය/භෞතික ප්‍රාග්ධනය)

- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අඛණ්ඩව යෙදවිය හැකි කල්පවත්නා ප්‍රාග්ධන වත්කම් වන කර්මාන්තශාලා යන්ත්‍ර උපකරන ගබඩා වැනි දේ ස්ථාවර ප්‍රාග්ධනය වේ.

- ප්‍රාග්ධනය භාවිතයට ගැනෙන කාලය මුළුල්ලේම කිසියම් ප්‍රතිලාභයක් එම සම්පත හිමිකරුට ලැබේ.

# කාරක ප්‍රාග්ධනය (සංසරණ ප්‍රාග්ධනය/ තොග පරිලේඛන)

- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගනු ලබන අමුද්‍රව්‍ය තොග, අර්ධ නිමි ද්‍රව්‍ය තොග, නිෂ්පාදනය වෙමින් පවතින භාණ්ඩ, බෙදා හැරීමට සූදානම් නිමි භාණ්ඩ තොග සංසරණ ප්‍රාග්ධනය ලෙස හඳුන්වයි.

- නිෂ්පාදන ක්‍රියාවලියට බාධාවකින් තොරව නිෂ්පාදනය ඉදිරියට කරගෙන යාමට සැලසුම් සකස් කර ගැනීමට වැදගත් වේ.

# ආර්ථික පොදු කාර්ය ප්‍රාග්ධනය

- ආර්ථිකයක භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා බෙදා හැරීමේ ක්‍රියාවලිය පහසු කරවන ප්‍රාග්ධන භාණ්ඩ ආර්ථික පොදු කාර්ය ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ.

- මේවා ආර්ථික යටිතල පහසුකම් ලෙස ද හඳුන්වයි.

උදා - වරාය, ගුවන්තොටුපළ, විදුලි බල පද්ධති, වාරිමාර්ග, ජල සම්පාදන ක්‍රම සහ මහා මාර්ග.

- ආර්ථික යටිතල පහසුකම් දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජන දිරි ගැන්වීමට හේතු වන අතර වර්තමානයේ බොහෝ රටවල රාජය විසින් මේවා සපයනු ලැබේ.

# සමාජ පොදු කාර්ය ප්‍රාග්ධනය

- මූලික මිනිස් අවශ්‍යතාවන් සපුරාලීමට යොදා ගනු ලබන සේවාවන් සම්පාදනය කෙරෙන ප්‍රාග්ධන භාණ්ඩ සමාජ පොදු කාර්ය ප්‍රාග්ධනය යනුවෙන් හඳුන්වයි.

උදා - අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාසල් ගොඩනැගිලි, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රෝහල් ගොඩනැගිල්ලි, ශල්‍යාගාර, වෛද්‍ය පර්යේෂණාගාර හා උපකරණ මෙන්ම කුණු කසළ ඉවත්කිරීමේ නල පද්ධති සහ පානීය ජල සම්පාදන පද්ධති අතර

- මෙමගින් සමාජ සුභසාධනය ඉටුවේ

# ආර්ථික විද්‍යාව

# පළමු පාඩම

Video - 04

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# මානව ප්‍රාග්ධනය

- ශ්‍රමිකයින් වෘත්තියක් තුළ වඩාත් ඵලදායි වීමට උනන්දු වන්නා වූ අධ්‍යාපනය, පුහුණුව, පර්යේෂණ, අත්දැකීම් හා සෞඛ්‍ය තත්ත්වය යන මේවායින් සැදුම්ලත් ශ්‍රමයේ නිපුණතාවය මානව ප්‍රාග්ධනය ලෙස හඳුන්වයි.
- මෙමගින් ශ්‍රමිකයාගේ ඵලදායීතාව වැඩි කරගත හැකි අතර නිෂ්පාදනය ප්‍රමාණාත්මක හා ගුණාත්මක බව ඉහළ නංවාගත හැකිය.

වැඩිදියුණු කළ ශ්‍රමය වූ මානව ප්‍රාග්ධනයට නිදසුන් වන්නේ සැලසුම් ශිල්පීන් හෝ විශ්වවිද්‍යාල ආචාර්යවරු පුහුණු ගුරුවරු සහ විශේෂඥ වෛද්‍යවරුන්.

# ස්වභාවික ප්‍රාග්ධනය

- ආර්ථිකයක පවත්නා ස්වභාවික සම්පත් ස්වාභාවික ප්‍රාග්ධනය වශයෙන් හඳුන්වයි.
- ස්වභාවික ප්‍රාග්ධනය සුලභවීම ආර්ථිකය වෘර්ධිය සඳහා වැදගත් වේ.

ස්වභාවික සම්පත් වලට නිදසුන් භූමිය, ගංගා, ඇළ දොළ, ඛනිජ සම්පත් දැක්විය හැකි.

# සමාජ ප්‍රාග්ධනය

සමාජ අන්තර් සම්බන්ධතා ගුණාත්මක හා ප්‍රමාණාත්මකව වර්ධනය කරන **ආයතන, ප්‍රතිමා, සාරධර්ම, සමිති සාමාජිකත්වයන්** හා සම්බන්ධතා ජාලයන් සමාජ ප්‍රග්ධනය වශයෙන් හඳුන්වයි.

# ප්‍රාග්ධනය බිහි වන මූලාශ්‍ර

- ප්‍රාග්ධනය බිහිවන්නේ ආයෝජනය තුළින්ය ආයෝජනය බිහිවන්නේ ඉතිරි කිරීම තුළින්ය එම නිසා ප්‍රාග්ධනය ආයෝජනය හා ඉතුරුම් අතර එකිනෙකට බැඳී පවතී.

## ආර්ථිකයක ඉතුරුම්

- දේශීය ඉතුරුම් (කුටුම්බ ඉතුරුම්, ව්‍යාපාරික ඉතුරුම්, රාජ්‍ය ඉතුරුම්)

- විදේශීය ඉතුරුම්( විදේශ ආධාර, විදේශ ආයෝජන, විදේශ ප්‍රධාන)

# ප්‍රාග්ධන මුදල් ලෙස නොසලකන්නේ ඇයි?

ප්‍රාග්ධනය යනු නිෂ්පාදන ක්‍රියාවලියට ආධාරක ලෙස යොදා ගන්නා මූර්ත වත්කම් ය.

මුදල් යොදාගෙන නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය මූර්ත වත්කම් අත්පත් කරගත හැකි වුවද මුදල් නිෂ්පාදන ක්‍රියාවලියේදී මූර්ථ වත්කමක් වශයෙන් යොදාගත නොහැකිය.

මේ නිසා ආර්ථික විද්‍යාවේදී මුදල් ප්‍රාග්ධනය යටතට නොගනී.

# ආර්ථික විද්‍යාව

## පලමු පාඩම

Video - 05

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

## ව්‍යවසායකත්වය

කිසියම් ආර්ථිකයක් තුළ විසිරී පවතින නිෂ්පාදන සාධක ඒකරාශී කරමින් නිෂ්පාදන කටයුතු සංවිධානය කිරීම මෙහෙයවීම සහ අවදානම් දරමින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම ව්‍යවසායකත්වයි.

නිෂ්පාදන සාධක අතුරෙන් වඩා වැදගත් තැනක් ව්‍යවසායකත්වයට හිමිවේ.

ඒ තුළින් නවෝත්පාදන සිදුවන නිසා ප්‍රාග්ධන වර්ධනයට එය ප්‍රබල ලෙස බලපායි.

### ව්‍යවසායකයෙකු ඉටු කරන කාර්ය භාරයන් පහත පරිදිවේ

- නිෂ්පාදන සම්පත් සංකලනය කරමින් කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් නිපදවීමට ප්‍රතිපත්තිමය තීරණ ගැනීම
- නිෂ්පාදන කටයුතු සංවිධානය කිරීම.
- නව්‍යතාවයන් හඳුන්වාදීම.
- අවදානම් දැරීම.

# ව්‍යවසායකත්වයේ ලක්ෂණ

- මානව සාධකයක් වීම.
- ආරම්භක ශක්තිය.
- අභියෝග වලට සාර්ථකව මුහුණ දීමේ හැකියාව.
- නායකත්ව ගුණාංග.
- අනාගත දැක්ම.
- ආත්ම විශ්වාසය.

# ව්‍යසායකයා හා කළමනාකරුවා අතර වෙනස්කම්

| ව්‍යසායකයා | කළමනාකරුවා |
|---|---|
| ව්‍යවසායකයා තීරන ගනී | ක්‍රියාවට නංවයි |
| ලාභ උපයයි | වැටුප් උපයයි |
| ව්‍යවසායකයා රක්ෂණය කළ නොහැකි අවදානමකට මුහුණ දෙන | කළමනාකරුවා එවැනි අවදානමකට මුහුණ නොදෙයි |

## ඵලදායිතාවය

යෙදවුම් ඒකකයකින් ලබාගන්නවා සාමාන්‍ය නිමයුම ඵලදායිතාව ලෙස හඳුන්වයි.

සාධක ඵලදායිතාවය පහත පරිදි ගණනය කරයි

$$\text{ඵලදායිතාව} = \frac{\text{නිමැවුම් ප්‍රමාණය}}{\text{යෙදවුම් ප්‍රමාණය}}$$

## ඵලදායිතාව තීරණය කරන සාධක

- තාක්ෂණය
- මානව ප්‍රාග්ධනය
- කළමනාකරණය
- ශ්‍රම විභජනය හා විශේෂීකරණය

# ආර්ථික විද්‍යාව

## පළමු පාඩම

Video - 06

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

## අවශ්‍යතා


මිනිසුන්ට ජීවත් වීම සඳහා අවශ්‍ය කෙරෙන මූලික ම දෑ අවශ්‍යතා නමින් හැඳින්වේ.

නිදසුන් - ආහාර,ඇඳුම් පැළැඳුම් ,නිවාස

## වුවමනා

අවශ්‍යතා ඉටු කර ගන්නා විවිධ ස්වරූප වුවමනා නම් වේ.

නිදසුන් -



# අවශ්‍යතා හා උවමනා අතර වෙනස්කම්

| අවශ්‍යතා | උවමනා |
| --- | --- |
| අවශ්‍යතා ජීව විද්‍යාත්මක මූලයන් සමඟ බැඳී පවතින අතර | වුවමනා සම්ප්‍රදායයන් සිරිත් විරිත් හා සංස්කෘතීන් ආදිය මත රඳා පවතී. |
| අවශ්‍යතා සීමිත වන අතර | වුවමනා අසීමිත වේ. |
| කාලයත් සමඟ අවශ්‍යතා වෙනස් නොවුණ ද | වුවමනා කාලයත් සමඟ වෙනස් වේ. |
| අවශ්‍යතා පොදු වන අතර | වුවමනා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. |

ද්‍රව්‍යාත්මක (භෞතික) වුවමනා , ද්‍රව්‍යාත්මක නොවන (මානසික) වුවමනා ලෙසින් වුවමනා වර්ග කළ හැකි අතර ආර්ථික විද්‍යාවේ අවධානය යොමු වන්නේ භාණ්ඩ හා සේවා පරිභෝජනයෙන් තෘප්තිමත් කරගත හැකි ද්‍රව්‍යාත්මක වුවමනාවන් කෙරෙහිය.

- මිනිස් වුවමනා සපුරා ගනු ලබන්නේ භාණ්ඩවලිනි.

# හිඟකම

මිනිස් වුවමනා වලට සාපේක්ෂ ව සලකා බලන සම්පත් ප්‍රමාණවත් නොවීම යි.

හිඟකම ගැටලුව පැන නඟිනුයේ සමාජයේ පවත්නා ප්‍රධාන ලක්ෂණ දෙකක් නිසා ය.

1. යම් දෙන ලද අවස්ථාවක මිනිසුන්ගේ වුවමනා අසීමිත වීම

2. යම් දෙන අවස්ථාවක එම වුවමනා සපුරා ගැනීමට අවශ්‍ය කරන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා යොදාගත හැකි සම්පත් ප්‍රමාණය සීමා වීම යි.

- හිඟකම සාපේක්ෂ සංකල්පයකි.

# ආර්ථික විද්‍යාව

## පළමු පාඩම Video - 07

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

- **සැපයුම් ඌණතාවය හිඟකමෙන් වෙනස් වේ**

වෙළෙඳපොළක භාණ්ඩයක හිගයක් පැවතීම සම්පත් හිගකම නොව භාණ්ඩ තොග වෙළෙඳ පොළට ළඟාවීමේ ප්‍රමාද දෝෂය මත ඇති වන්නකි. වෙළෙඳපළට තොග ළඟා වීමෙන් පසු ව එම තත්ත්වය මඟ හැරී යයි.

- **අකාර්යක්ෂම තාවය නිසා හිඟකම ඇති නොවේ**

ඉතා පිරිමැසුම් ලෙස සම්පත් භාවිතයට ගැනීම සම්පත් කාර්යක්‍ෂම ලෙස උපයෝජනය කිරීමක් වන අතර වුවමනා අසීමිතව පවතින තාක් කල් සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කළද හිගකම නැමැති ගැටලුව විසඳිය නොහැකි ය.

- **හිගකම සැම ආර්ථිකයකට ම පොදුවේ බලපාන කේන්ද්‍රීය ගැටලුවකි.**

හිගකම ආර්ථික විද්‍යාවේ කේන්ද්‍රීය ගැටලුව ලෙස සැලකෙන්නේ, පහත සඳහන් හේතු නිසාය.

1. සියලු ආර්ථික කාරකයන් මෙම ගැටලුව පොදු වේ.
2. ඕනෑ ම සමාජයක් කුමක්, කොපමණ, කෙසේ, කා සඳහා නිපදවිය යුතු ද යන මූලික ආර්ථික ප්‍රශ්නවලට පොදුවේ මුහුණ දෙන නිසා
3. හිගකම සැම සමාජයකට ම පොදුවීම නිසා

# තේරීම

සම්පත් හිඟ සහ විකල්ප ප්‍රයෝජනවලින් යුක්ත නිසාත් මිනිසුන්ට තමා කැමැති වුවමනා ඉටුකර ගැනීම වෙනුවට එක් වුවමනාවක් තේරීමට සිදු වේ.

නිදසුන් ලෙස භූමිය තුළ කර්මාන්තශාලා ඉදිකිරීම, ගොවිතැන් කිරීම සහ ක්‍රීඩා පිටි සැකසීම වැනි විකල්ප ප්‍රයෝජන පවතින විට එම, විකල්පයන් අතුරින් කුමන විකල්පය තෝරා ගනු ලබන්නේ ද යන්න තීරණය කිරීමට සිදු වේ.

මේ නිසා ප්‍රමුඛත්වයක් දිය යුත්තේ කුමන වුවමනාවට ද, පසුව සපුරා ගැනීමට අපේක්ෂා කරන වුවමනා කුමක් ද යන්න පුද්ගලබද්ධව පෙළගැස්වීම සිදු කරයි.

ආර්ථිකයක කුටුම්බ, ව්‍යාපාරික ආයතන, රජය සහ වෙනත් සංවිධාන විවිධ ආකාරයට තේරීම කරයි

ආර්ථික පද්ධතියක් තුළ තේරීමේ ප්‍රශ්නය හටගන්නේ ඍ

1. සම්පත්වල පවත්නා හිඟකම හා
2. සම්පත්වල විකල්ප භාවිත හැකියාව මුල් කරගෙන යි.

# ආර්ථික විද්‍යාව

# පළමු පාඩම

Video - 08

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# ආවස්ථික පිරිවැය

**විකල්ප ප්‍රයෝජන අතුරින් එක් විකල්පයක් තෝරාගත් විට අනෙක් විකල්ප අවස්ථා කැප කිරීමට සිදු වේ.**

**මෙලෙස " සම්පතක විකල්ප ප්‍රයෝජන අතුරින් එක් විකල්පයක් තෝරාගත හොත් ඒ වෙනුවෙන් කැප කරන ඊළඟ හොඳ ම විකල්පයේ වටිනාකම ආවස්ථික පිරිවැය නමින් හඳුන්වයි.**

**ආවස්ථික පිරිවැය, මූර්ත පිරිවැය ලෙස ද ආර්ථික පිරිවැය ලෙස ද හඳුන්වයි.**

## නිදසුන්

කලින් සඳහන් කළ නිදසුනේ භූමිය තුළ කර්මාන්තශාලාවක් ඉදි කිරීම, ගොවිතැන් කිරීම සහ ක්‍රීඩා පිටි සැකසීම වැනි විකල්ප ප්‍රයෝජන පවතින විට, පුද්ගලයකු ඉහත භූමියේ විකල්ප ප්‍රයෝජන ඔහුගේ ප්‍රමුඛතාව මත පෙළගැස්වූ විට,

1 කර්මාන්තශාලාවක් ඉදි කිරීම

2 ගොවිතැන් කිරීම

3 ක්‍රීඩා පිටිය ඉදි කිරීම වේ නම්

ඉහත භූමියේ විකල්ප ප්‍රයෝජන අතරින් ඔහු කර්මාන්තශාලාවක් ඉදිකිරීම තෝරාගත් විට ඊළඟට ඔහු කැප කරන හොඳ ම විකල්පය වන්නේ ගොවිතැන් කිරීම නම් කර්මාන්තශාලාවක් ඉදි කිරීමේ ආවස්ථික පිරිවැය වන්නේ ගොවිතැන් කිරිමෙන් ලැබෙන අස්වැන්න යි.

## තේරීමක ආවස්ථික පිරිවැය සම්බන්ධයෙන් වැදගත් කරුණු කිහිපයකි.

**1.** ආවස්ථික පිරිවැය මූල්‍ය සංකල්පයක් නොව මූර්ත සංකල්පයකි.

එනම් ආවස්ථික පිරිවැය පෙන්වන්නේ විකල්ප අතරින් එක් විකල්පයක් තෝරාගත් විට අහිමි වන ඊළඟ හොඳ ම විකල්පයේ මූර්ත වටිනාකම යි. එහි මූල්‍ය වටිනාකම නොවේ.

**2.** ආවස්ථික පිරිවැය ආත්මගත සංකල්පයකි.

එනම් ආවස්ථික පිරිවැය ප්‍රකාශ කළ හැක්කේ එම තේරීම කරන පුද්ගලයාට පමණි. එය පුද්ගලයාගෙන් පුද්ගලයාව වෙනස් වේ.

**3.** ආවස්ථික පිරිවැය නිසා බාහිර පිරිවැයක් ද හට ගනියි.

# ආර්ථික විද්‍යාව

## පළමු පාඩම Video - 09

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# භාණ්ඩයක

ධන තෘප්තියක් හෙවත් උපයෝගිතාවක් ලබාදෙන ඕනෑ ම දෙයක් ආර්ථික විද්‍යාවේ දී භාණ්ඩයක් ලෙසින් හැඳින්වේ. මිනිස් වුවමනා සපුරා ගනු ලබන්නේ භාණ්ඩවලිනි.

## මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරා ගන්නා භාණ්ඩ

1. ආර්ථික නොවන භාණ්ඩ (නොමිල භාණ්ඩ/ පිරිවැය රහිත භාණ්ඩ / ස්වාභාවික භාණ්ඩ)
2. ආර්ථික භාණ්ඩ ලෙස වර්ග කළ හැකිය

## ආර්ථික නොවන භාණ්ඩ

ශුන්‍ය මිලක දී අසීමිත සැපයුමක් සහිත භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ වේ.

නිදසුන් :- ස්වභාවධර්මයෙන් ලැබෙන වාතය, ජලය සහ හිරු එළිය

ආර්ථික නොවන භාණ්ඩවල සම්පත් පිරිවැයක් හා ආවස්ථික පිරිවැයක් නොපවතී.

# ආර්ථික භාණ්ඩ

සැපයුමෙහි හිඟකමක් දක්නට ලැබෙන භාණ්ඩ ආර්ථික භාණ්ඩ වේ

නිදසුන් - පෑන් , පොත් , හාල් , පිටි

- ආර්ථික භාණ්ඩවල සම්පත් පිරිවැයක් හා ආවස්ථික පිරිවැයක් පවතී

- ආර්ථික භාණ්ඩ මිනිසා මැදිහත් වී සාධක සංයෝග කර නිපදවයි

- ආර්ථික භාණ්ඩ හිඟ සම්පත් යොදා ගෙන නිපදවනු ලබන බැවින් ඒවාට මිලක් ද පවතින අතර,ආර්ථික භාණ්ඩවල තේරීම පිළිබඳ ප්‍රශ්නයක් ද පවතී.

- ආවස්ථික පිරිවැය ධන සංකල්පයක් වන අතර ආවස්ථික පිරිවැය ධන අගයක් ගන්නේ ආර්ථික භාණ්ඩ සම්බන්ධයෙන් පමණි.

ආර්ථික භාණ්ඩ කිසි විටෙකත් ආර්ථික නොවන භාණ්ඩ බවට පත් නොවුණ ද ආර්ථික නොවන භාණ්ඩ ආර්ථික භාණ්ඩ බවට පත්වන අවස්ථා පවතී

නිදසුන් :- -

කිමිඳුම්කරුවකු කිමිඳීමේ දී භාවිත කරන ඔක්සිජන්

රෝගියකුට ලබාදෙන ඔක්සිජන්

සූර්ය බලයෙන් නිපදවන සූර්යකෝෂ

බෝතල් කරන ලද ජලය

- මෙවැනි අවස්ථාවල දී භාවිත වන ඔක්සිජන්, සූර්යාලෝකය ජලය ආදිය ආර්ථික භාණ්ඩ බවට පත් වන අතර, එසේ වන්නේ සම්පත් පිරිවැයක් හා ආවස්ථික පිරිවැයක් ඒ තුළ පවත්නා බැවිනි

- මිනිස් වුවමනා තෘප්තිමත් කර ගැනීම සඳහා අවශ්‍ය කෙරෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමට යොදා ගත හැකි සියලු ම නිෂ්පාදන සාධක සම්පත් නමින් හැඳින්වේ

## සම්පත් ස්වරූප දෙකකි. එනම්

1. ආර්ථික සම්පත්
2. ආර්ථික නොවන සම්පත්

## ආර්ථික සම්පත්

- සමාජයේ අසීමිත වුවමනාවලට සාපේක්ෂ ව සැපයුම සීමා සහිත හෝ හිඟකමක් ඇති හෝ සම්පත් ආර්ථික සම්පත් ලෙසින් හැඳින්වේ.
- හිඟකම ආර්ථික සම්පත්වල මූලික ලක්ෂණය වන බැවින් ආර්ථික සම්පත් උපයෝජනයේ දී ආවස්ථික පිරිවැයක් හට ගනී.

  නිදසුන් :- භාවිත කරන ඉඩමක්, ඉන්ධන

## ආර්ථික නොවන සම්පත්

- ස්වභාවධර්මයෙන් නොමිලේ ලැබෙන හා ආවස්ථික පිරිවැයක් නොදරන සම්පත් මෙන් ම නිෂ්පාදනය සඳහා යොදා ගත හැකි හිඟකමක් රහිත සම්පත් ආර්ථික නොවන සම්පත් වේ.

  නිදසුන් :- හිරු එළිය, වාතය, වැසි ජලය

# ස්වාභාවික සම්පත්

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා ස්වභාවධර්මයෙන් ලැබී ඇති සම්පත් ස්වාභාවික සම්පත් ලෙසින් හැඳින්වේ .

නිදසුන් :- හිරු එළිය, වාතය, වැසි ජලය

## ස්වාභාවික සම්පත් වර්ග දෙකකි

1. ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත්
2. ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත්

## ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත්

භාවිතයට ගැනීමත් සමඟ විනාශයට පත් වුව ද ප්‍රතිජනනය වන සම්පත් ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් වේ. මෙම සම්පත් නැවත ඇති කළ හැකි ය.

නිදසුන් :- වන සම්පත්, මත්ස්‍ය සම්පත්

## ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත්

භාවිතයට ගැනීම නිසා ක්ෂය වීමට පත් වන නැවත ඇති කළ නොහැකි සම්පත් ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් ය.

නිදසුන් :- මිනිරන්, ගෑස්, රත්රන්, යපස්, ගල් අඟුරු

ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් වේගයෙන් ක්‍ෂය වෙමින් පවතින බැවින් එම සම්පත් අනාගතයට ඉතිරි නොවිය හැකි ය. මේ නිසා තිරසාර සංවර්ධනය අඩාළ විය හැකි බැවින් ස්වාභාවික සම්පත් ආරක්‍ෂා කිරීම වැදගත් වේ

- ස්වාභාවික සම්පත් අසීමිත ව භාවිතයට ගැනීම නිසා ගෝලීය වශයෙන් ගැටලු රැසකට මුහුණ පෑමට සිදු වේ

නිදසුන් :-

1 වායුගෝලීය උණුසුම ඉහළ යාම

2 ග්ලැසියර් දිය වීම

3 ඕසෝන් ස්තරය සිදුරු වීම

4 ජලය හිඟයකට මුහුණ පෑමට සිදු වීම

5 ගංවතුර හා නායයාම් වැනි ස්වාභාවික උපද්‍රව

- මෙම ගැටලු නිසා ඇති වන අහිතකර ප්‍රතිඵලවලින් වැළකීම සඳහා ස්වාභාවික සම්පත් රැකගැනීම අතිශයින් ම වැදගත් වේ

## ආවස්ථික පිරිවැය ශුන්‍ය අගයක් ගන්නා අවස්ථා කිහිපයකි.

1. සම්පත් අසීමිත ව පවතින විට ( ආර්ථික නොවන භාණ්ඩ තිබීම)

2. කිසියම් සම්පතකින් විකල්ප ප්‍රයෝජන නොමැති විට

3. සම්පත් සේවා වියුක්ත ව පවතින විට

# ආර්ථික විද්‍යාව

## පළමු පාඩම Video - 10

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# මූලික තේරීම්/මූලික ආර්ථික ප්‍රශ්න

- සම්පත්වල පවත්නා හිඟකම සහ හිඟ සම්පත්වල විකල්ප ප්‍රයෝජන නිසා හැම සමාජයකට මූලික තේරීම් තුනක් කිරීමට සිදු වේ.

- එම තේරීම් තුන ඕනෑ ම සමාජයකට පොදු ය.

- ආර්ථික විද්‍යාවේ දී මූලික ආර්ථික ප්‍රශ්න ලෙසින් හඳුන්වන්නේ එම තේරීම් ය.

- ඒ අනුව මූලික ආර්ථික ප්‍රශ්න වන්නේ,

1. කුමක් / කොපමණ නිෂ්පාදනය කළ යුතු ද?

2. කෙසේ නිෂ්පාදනය කළ යුතු ද?

3. කා සඳහා නිෂ්පාදනය කළ යුතු ද?

# කුමක් / කොපමණ නිෂ්පාදනය කළ යුතු ද?

සම්පත්වල හිඟකම සහ හිඟ සම්පත්වල විකල්ප ප්‍රයෝජන තිබීම නිසා කවර සමාජයකට වුවද කුමක් / කොපමණ නිපදවනවා ද යන මූලික ආර්ථික ප්‍රශ්නයට මුහුණ දීමට සිදු වේ.

නිදසුන් :-

හිඟ සම්පත් උපයෝගී කරගෙන,
රෝහල් හදනවාද පාසල් හදනවා ද?
කර්මාන්තශාලා හදනවා ද?
ක්‍රීඩා පිටි හදනවා ද?
පාරිභෝගික භාණ්ඩ නිපදවනවා ද?
ප්‍රාග්ධන භාණ්ඩ නිපදවනවා ද?
වශයෙන් නිපදවන භාණ්ඩය තීරණය කිරීමට සිදු වේ.

එසේ ම නිපදවීමට තීරණය කළ භාණ්ඩය කොපමණ ප්‍රමාණයකින් නිපදවිය යුතුද යන්නත් තීරණය කළ යුතු ය.

නිදසුන්:-

රෝහල් කොපමණ ප්‍රමාණයක් ද?
කර්මාන්තශාලා කොපමණ ප්‍රමාණයක් ද?
ප්‍රාග්ධන භාණ්ඩ කොපමණ ද?

මෙලෙසින් කුමන භාණ්ඩයක් කොපමණ ප්‍රමාණයකින් නිපදවන්නේ ද යන්න තීරණය කොට ඒ සඳහා සම්පත් බෙදා වෙන් කිරීම කළ යුතු වේ.

එසේ ම සම්පත්වලින් කොපමණ ප්‍රමාණයක් වර්තමාන පරිභෝජනයට යොදා ගන්නවාද, කොපමණ ප්‍රමාණයක් අනාගත පරිභෝජනයට යොදා ගන්නවා ද / බෙදා හරිනවාද යන්න තීරණය කළ යුතු වේ.

කුමක් / කොපමණ නිපදවනවා ද යන්න තීරණය කොට ඒ සඳහා සම්පත් බෙදා වෙන් කිරීමක් සිදු වන නිසා කුමක් කොපමණ නිපදවනවා ද යන මූලික ආර්ථික ප්‍රශ්නය සම්පත් බෙදා වෙන් කිරීමේ ප්‍රශ්නය ලෙසින් ද හැඳින්විය හැකි ය.

# කෙසේ නිෂ්පාදනය කළ යුතු ද?

සම්පත් හිඟකම හා හිඟ සම්පත්වල විකල්ප ප්‍රයෝජන පැවතීම නිසා කවර සමාජයකට වුව ද පොදුවේ කෙසේ නිෂ්පාදනය කළ යුතු ද? යන ප්‍රශ්නයට ද මුහුණ දීමට සිදු වේ.

කෙසේ නිපදවනවා ද යන මූලික ආර්ථික ප්‍රශ්නයෙන් අදහස් වන්නේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා කුමන නිෂ්පාදන ශිල්ප ක්‍රමයක්, කුමන තාක්ෂණයක් භාවිතාකළ යුතු ද යන්නයි.

එනම් භාණ්ඩ නිපදවීමට කවර සම්පත්, කවර අනුපාතයකට භාවිත කළ යුතු ද යන්න තීරණය කළ යුතු වේ.

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රම සූක්ෂ්ම නිෂ්පාදන ශිල්ප ක්‍රමය සහ ප්‍රාග්ධන සූක්ෂ්ම නිෂ්පාදන ශිල්ප ක්‍රමය ලෙස විකල්ප නිෂ්පාදන ශිල්ප ක්‍රම දෙකක් භාවිතා කළ හැකි ය.

ශ්‍රමය වැඩියෙන් හා ඊට සාපේක්ෂ ව ප්‍රාග්ධනය අඩුවෙන් යොදා ගන්නා නිෂ්පාදන ශිල්ප ක්‍රමය ශ්‍රම සූක්ෂ්ම නිෂ්පාදන ශිල්ප ක්‍රමය වන අතර ප්‍රාග්ධනය වැඩියෙන් හා ඊට සාපේක්ෂව ශ්‍රමය අඩුවෙන් යොදා ගන්නා නිෂ්පාදන ශිල්ප ක්‍රමය ප්‍රාග්ධන සූක්ෂ්ම නිෂ්පාදන ශිල්ප ක්‍රමය ලෙස හැඳින්වේ.

විකල්ප නිෂ්පාදන ශිල්ප ක්‍රම අතරින් කුමන හෝ එක් නිෂ්පාදන ශිල්ප ක්‍රමයක් භාවිතා කොට නිපදවීමක් සිදුවන නිසා කෙසේ නිෂ්පාදනය කළ යුතු ද යන මූලික ආර්ථික ප්‍රශ්නය නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නය ලෙසින් ද හැඳින්වේ.

## කා සඳහා නිෂ්පාදනය කළ යුතු ද?

කා සඳහා නිපදවනවා ද යන්නෙන් අදහස් වන්නේ සමාජයේ සමස්ත නිෂ්පාදිතය කවුරුන් අතර බෙදී යනවා ද යන්න යි.

එනම් හිඟ සම්පත් යොදා ගනිමින් නිෂ්පාදනය කරනු ලබන සීමිත භාණ්ඩ හා සේවා ප්‍රමාණය සමාජයේ කවුරුන් විසින් හිමි කර ගනු ලැබේ ද? භුක්ති විඳිනු ලැබේ ද? යන්න මෙයින් අදහස් වේ.

නිපදවන භාණ්ඩ භුක්ති විඳීමේ හැකියාව රඳා පවතින්නේ ඒ ඒ පුද්ගලයන් ලබන ආදායම මතය.

සාධක හිමියෝ වැටුප් , බදු කුලී , පොළී හා ලාභ වශයෙන් ආදායම් උපයති.

ඒ ඒ පුද්ගලයන් ලබන ආදායම වැඩි හෝ අඩු හෝ වන්නේ සාධක හිමිකාරත්වය සහ සාධක මිල පදනම් කරගෙනය.

සාධක ආදායම් වැඩියෙන් ලබන අයට නිපදවන භාණ්ඩවලින් වැඩි ප්‍රමාණයක් භුක්ති විඳීමට හැකියාව ලැබෙන අතර සාධක ආදායම අඩුවෙන් ලැබෙන අයට හැකි වන්නේ අඩු භාණ්ඩ ප්‍රමාණයක් භුක්ති විඳීමට ය.

මෙලෙසින් නිපදවන භාණ්ඩ ප්‍රමාණය භුක්ති විඳීම ඒ ඒ පුද්ගලයින්ගේ ආදායම මත තීරණය වන නිසා කා සඳහා නිපදවිය යුතු ද යන්න ආදායම් බෙදී යාම පිළිබඳ ප්‍රශ්නය ලෙසින් ද හැඳින්වේ.

# ආර්ථික විද්‍යාව

## පළමු පාඩම Video - 11

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# ආර්ථික පද්ධති

මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සමාජයක් තුළ ජීවත් වන මිනිසුන් විසින් නිර්මාණය කරනු ලැබ ඇති යන්ත්‍රණය හෙවත් ආයතනික වැඩ පිළිවෙළ ආර්ථික පද්ධතියක් හෙවත් ආර්ථික සංවිධානයක් ලෙස හැඳින් වේ.

ආර්ථික පද්ධතියක දී මිනිසා විසින් සකසා ගන්නා නීති මාලාවකට අනුව එහි ඇති ආයතන සමූහයක් ක්‍රියාත්මක වේ.

එම ආයතන මිනිසුන් ගෙන් සමන්විත සජීව ඒකක වන අතර, ඒ නිසා ම එහි ක්‍රියාකාරිත්වය ද සක්‍රිය වූවකි.

භෞතික පද්ධතියක් තුළ පවත්නා ස්වාභාවික වස්තු මෙන් ආර්ථික පද්ධතියක් තුළ දක්නට ලැබෙන වස්තු වන්නේ එහි පවත්නා ආර්ථික ආයතන ය.

මෙම ආර්ථික ආයතන ආර්ථික පද්ධතියක මූලිකාංග, ආයතනික ලක්ෂණ ආදි නම් වලින්ද හැඳින්වේ.

ඒ ඒ රටවල පවතින සමාජ, සංස්කෘතික සහ ඓතිහාසික රටාවන් මත විවිධ ස්වරූපයේ ආයතනික රටාවන් ඒ ඒ ආර්ථිකයන්හි දැකිය හැකි ය.

# ආර්ථික පද්ධතියක දක්නට ලැබෙන මූලිකාංග

- කුටුම්බ
- ආණ්ඩුව
- ව්‍යාපාරික අංශය
- කම්කරු සංවිධාන
- රාජ්‍ය නොවන සංවිධාන
- වෙළෙඳපොළවල්
- සානුබල
- නෛතික ව්‍යූහය
- සිරිත් විරිත් සාම්ප්‍රදායන් හා සංස්කෘතිය

මෙම මූලිකාංගයන් අතුරෙන් ආර්ථික පද්ධතියක තීරණගැනීම හා සම්බන්ධ වන විශේෂ පාර්ශ්ව වන්නේ කුටුම්බ, ආණ්ඩුව, ව්‍යාපාරික අංශය, කම්කරු සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන ආදිය යි.

## කුටුම්බ

- ආර්ථික පද්ධතියක ඇති වැදගත්ම ආයතනික ලක්ෂණයක් වන්නේ කුටුම්බ ය.
- එක ම අයවැයකින් එක ම ගෘහයක් තුළ එකට වාසය කරන පිරිසක් කුටුම්බයක්සේ සැලකේ.

- විවිධ සමාජවල සිටින කුටුම්බ එක්කෝ න්‍යෂ්ටික පවුල්, එසේත් නැතිනම් විස්තෘත පවුල් විය හැකි ය.

- කුටුම්බයන් එක් අතකින් ශ්‍රම සැපයුම්කරුවන් වන අතර, නිෂ්පාදනය කරනු ලබන බොහෝ භාණ්ඩ හා සේවා සඳහා පාරිභෝගිකයන් වන්නේ ද කුටුම්බ ය.
- එසේ ම නිෂ්පාදන සාධක පිළිබඳ අයිතිය ද කුටුම්බයන් සතු ය.
- ආර්ථික පද්ධතියක කුටුම්බ විසින් ඉටු කරනු ලබන වැදගත් කාර්යභාර පවතී.

- කුටුම්බ විසින් ගනු ලබන ආර්ථික තීරණ ලෙසින් සැලැකෙන්නේ ද කුටුම්බයන්ගේ එම කාර්යභාර ය.

- එම කාර්යභාරය පහත දැක් වේ.

1. සාධක සැපයීම පිළිබඳ තීරණ ගැනීම

2. භාණ්ඩ හා සේවා මිල දී ගැනීම පිළිබඳ තීරණ ගැනීම

3. ආදායමෙන් කොපමණ පාරිභෝජනය කරන්නේ ද කොපමණ ඉතිරි කරන්නේ ද යන්න තීරණය ගැනීම

# ආණ්ඩුව

සෑම රටක ම කුමන හෝ ස්වරූපයක ආණ්ඩුවක් පවතින අතර එය සතු ව විශාල කාර්යභාරයක් ද පවතී.

- ආණ්ඩුවක් සතු කාර්යභාරය පහත දැක් වේ.

1. ආර්ථික හා පෞද්ගලික අයිතිවාසිකම් ආරක්ෂා කරදීම
2. කර්මාන්ත හා ව්‍යාපාර නියාමනය කිරීම
3. භාණ්ඩ හා සේවා සැපයීම
4. ආදායම් පුනර්ව්‍යාප්තිය
5. නීතිරීති හා ව්‍යවස්ථාවන් සැකසීම

# ව්‍යාපාරික ආයතන

ආර්ථිකයක විවිධ ස්වරූපයේ ව්‍යාපාරික ආයතන පවතී.

නිදසුන්:- පෞද්ගලික ආයතන , සමුපකාර , රාජ්‍ය ආයතන

ව්‍යාපාරික අංශය සතු කාර්යභාරයන් පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

1. නිෂ්පාදන සම්පත් මිල දී ගැනීම

2. කුමක්, කොපමණ , කෙසේ , කා සඳහා නිපදවන්නේ ද යන්න තීරණය කිරීම

3. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම

4. සාධාරණ මිලකට භාණ්ඩ හා සේවා අලෙවි කිරීම

# කම්කරු සංවිධාන

ශ්‍රමිකයන් විසින් ගොඩනගා ගනු ලබන කම්කරු සංවිධානවල කාර්යභාර කීපයක් පහත දැක්වේ.

1. සේවක අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම

2. සේවා නියුක්තිය, නිෂ්පාදනය තාක්ෂණය හා වැටුප් මට්ටම් කෙරෙහි බලපෑම් ඇති කිරීම

# රාජ්‍ය නොවන සංවිධාන

නූතන ආර්ථිකයන්හි වර්ධනය වෙමින් පවතින රාජ්‍ය නොවන සංවිධාන සතු කාර්යභාර රැසක් පවතී.

නිදසුන්:-

- දිළිඳුකම තුරන් කිරීම

- පරිසර සංරක්ෂණය

- මානව අයිතිවාසිකම් (හිමිකම්) ආරක්ෂා කිරීම

- ස්වාභාවික ආපදා තත්ත්වයන් දී අවතැන් වූ ජනතාවගේ සුභසාධනය වෙනුවෙන් කටයුතු කිරීම.

# ආර්ථික විද්‍යාව

## පළමු පාඩම Video - 12

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# ආර්ථික පද්ධති වර්ග කිරීම

ආර්ථික පද්ධතියක් ක්‍රියාත්මක වන්නේ නීතිරීති, සම්ප්‍රදාය, සිරිත් විරිත් යනාදියෙන් සමන්විත ආයතනික ව්‍යූහයක් අනුව ය.මෙම ආයතනික ව්‍යූහයන්ගේ ස්වරූපයන් මත ආර්ථික පද්ධති අතර වෙනස්කම් දක්නට ලැබේ.

එ අනුව ආර්ථික පද්ධති වර්ග කිරීම සඳහා භාවිත කරන නිර්ණායක කිහිපයකි.

- තීරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය
- සම්පත් හිමිකාරිත්වයේ ස්වරූපය
- සානුබලවල ස්වභාවය

## තීරණ සම්බන්ධීකරණ යන්ත්‍රණයේ ස්වරූපය යන නිර්ණායක මත ආර්ථික පද්ධති පහත පරිදි වර්ග කළ හැකි ය.

- වෙළෙඳපොළ ආර්ථික පද්ධති

තීරණ සම්බන්ධීකරණ යන්ත්‍රණය වන්නේ - මිල යන්ත්‍රනය/මිල ක්‍රමය

- විධානගත ( සැලසුම්ගත) ආර්ථික පද්ධති

තීරණ සම්බන්ධීකරණ යන්ත්‍රණය වන්නේ - සැලසුම් යන්ත්‍රනය

- සාම්ප්‍රදායික ආර්ථික පද්ධති

තීරණ සම්බන්ධීකරණ යන්ත්‍රණය වන්නේ - සිරිත් විරිත් හා සම්ප්‍රදායන්

**නිෂ්පාදන සම්පත්වල හිමිකාරිත්වය හා දේපොළ අයිතිවාසිකම්වල ස්වභාවය යන නිර්ණායක මත ආර්ථික පද්ධති පහත පරිදි වර්ග කළ හැකි ය.**

- **ධනේශ්වර ආර්ථික පද්ධති**

ධනේශ්වර ආර්ථික පද්ධතියක දේපොළ හිමිකම පෞද්ගලික අංශය සතුවේ.

- **සමාජවාදි ආර්ථික පද්ධති**

සමාජවාදී ආර්ථික පද්ධතියක සම්පත් හිමි කරගනු ලබන්නේ රජය විසිනි.

- **සාම්ප්‍රදායික ආර්ථික පද්ධති**

සාම්ප්‍රදායික ආර්ථික පද්ධතියක සම්පත් පොදු හිමිකාරිත්වයක පවතී.

## විවිධ ආර්ථික පද්ධතිවල දක්නට ලැබෙන සානුබල ප්‍රධාන ස්වරූප යන නිර්ණායක මත ආර්ථික පද්ධති පහත පරිදි වර්ග කළ හැකි ය.

- ද්‍රව්‍යාත්මක ප්‍රතිලාභ සහිත සානුබල

වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක ද්‍රව්‍යාත්මක සානුබල ප්‍රධානවේ. ලාභ ඉපැයීම සානුබලයකි.

- බලය පදනම් කරගත් සානුබල

විධාන මගින් මෙයෙවන ආර්ථික පද්ධතිවල සානුබල ක්‍රියාත්මක වන්නේ අධිකාරි බලය තුළිනි.

- සදාචාරාත්මක සානුබල ( ජනතාව වෙනුවෙන් මෙහෙවර)

ආචාරධර්ම භාවමය පදනම් ඔස්සේ ද සානුබල ක්‍රියාත්මක වේ. ශුද්ධ, ස්වාභාවික විපත්, ආණ්ඩු බිඳ වැටීම් වැනි සිදුවීම් නිසා ආර්ථිකයේ කම්පන හටගත් අවස්ථාවල දී සදාචාර පදනම ඔස්සේ, පුද්ගලයෝ එම අවස්ථාවේ කළ යුතු නිවැරදි දේ තීරණය කර, ඒ අනුව කටයුතු කරති. එයින් පුද්ගලයෝ අභිප්‍රේරණය වෙති.

## ආර්ථික පද්ධති වර්ග කිරීම සඳහා භාවිත කරන නිර්ණායක සියල්ලම සැලකිල්ලට ගෙන පහත පරිදි ආර්ථික පද්ධති වර්ග කළ හැකි ය.

- වෙළෙඳපොළ ආර්ථික පද්ධති
- විධාන හා නියෝග පදනම් කරගත් ආර්ථික පද්ධති හෙවත් සැලසුම්ගත ආර්ථික පද්ධති
- මිශ්‍ර ආර්ථික පද්ධති

# ආර්ථික විද්‍යාව

## පළමු පාඩම

Video - 13

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# වෙළෙඳපොළ ආර්ථික පද්ධති

වෙළෙඳපොළ අර්ථ ක්‍රමය යනු වෙළෙඳපොළෙහි ඉල්ලුම් හා සැපයුම් බලවේග අනුව තීරණය වන මිල මත මූලික ආර්ථික ප්‍රශ්න විසඳන ආර්ථික ක්‍රමයකි.

වෙළෙඳපොළ අර්ථ ක්‍රමය, ධනවාදී ආර්ථික ක්‍රමය, නිදහස් ව්‍යවසාය අර්ථ ක්‍රමය ආදී විකල්ප නම් වලින් ද හඳුන්වයි.

## වෙළෙඳපොළ ආර්ථිකයක මූලික ලක්ෂණ පහත පරිදි දැක්විය හැකි ය.

- දේපොළ පිළිබඳ පෞද්ගලික හිමිකමක් තිබීම - (දේපොළ පවත්වා ගැනීමට,විකිණීමට,පැවරීමට හා භුක්ති විදීමට ඇති අයිතිය)
- නිදහස් ව්‍යවසාය හා තේරීමේ නිදහස
- තරගකාරී වෙළෙඳපොළ තත්ත්ව
- ස්වාර්ථය මත පදනම් කරගත් සානුබල පැවතීම (තමන්ගේ වාසිය හෙවත් ප්‍රතිලාභය උදෙසා කටයුතු කිරීමයි)
- මිල යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය
- පාරිභෝගික ස්වාධිපත්වය (වෙළඳපොළේ ප්‍රධාන බලධාරියා පාරිභෝගිකයාය, නිපදවිය යුත්තේ කුමන භාණ්ඩයද, වෙළඳපොළ තුල සිටිය යුත්තේ කුමන ව්‍යාපාරයද යන්න පාරිභෝගිකයා තිරණය කරයි)
- ආණ්ඩුවේ කාර්යභාරය සීමා සහිත වීම

## මිල යාන්ත්‍රණය

ආර්ථිකය පුරා විසිරි සිටින පාරිභෝගිකයන්, නිෂ්පාදකයන්,සාධක හිමියන් තම ස්වාර්ථය උදෙසා ගනුලබන තිරණ මනාව සම්බන්දීකරණය කරමින් ව්‍යාකුලත්වයක් ඇති නොකොට ආර්ථිකය ක්‍රමාණුකුලව මෙහේය වීම සිදු කරනු ලබන්නේ මිල යන්ත්‍රනය මඟිනි.

## භාණ්ඩ වෙළඳපොළ

භාණ්ඩ හා සේවා විකිණීමත්, මිලට ගැනීමත් සිදු කෙරෙන වෙළෙඳපොළ භාණ්ඩ වෙළෙඳපොළ නමින් හැඳින්වේ.

මෙහි

ගැනුම්කරුවා - කුටුම්බ වන අතර විකුණුම් කරුවා - ව්‍යාපාර වේ

## සාධක වෙළඳපොළ

භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය වැනි නිෂ්පාදන සාධක විකිණීමත්, මිලට ගැනීමත් සිදු කෙරෙන වෙළෙඳපොළ සාධක වෙළෙඳපොළ නමින් හැඳින්වේ.

මෙහි

ගැනුම්කරුවා - ව්‍යාපාර වන අතර විකුණුම්කරුවා - කුටුම්බ වේ

## වෙළෙඳපොළ ආර්ථිකයක මූලික ආර්ථික ප්‍රශ්න විසදීමේ සම්බන්ධීකරණ යාන්ත්‍රණය ලෙස මිල යාන්ත්‍රණය කටයුතු කරයි.

කුමක් කොපමන නිෂ්පාදනය කරනවාද

↓

භාණ්ඩ වෙළඳපොළ

සාධක වෙළඳපොළ

↓

මිල සංඥා

↓

ලාභදායිවය පදනම් කරගෙන

↓

ලාභය වැඩි භාණ්ඩ වලින් වැඩියෙන් නිපදවන අතර ලාභය අඩු භාණ්ඩ වලින් අඩුවෙන් නිපදවයි

කෙසේ නිෂ්පාදනය කරනවාද

↓

සාධක වෙළඳපොළ

↓

මිල සංඥා

↓

අඩුම පිරිවැය සහිත තාක්ෂණය ශිල්ප ක්‍රමය පදනම් කරගෙන

↓

අඩු පිරිවැය සහිත තාක්ෂණය ශිල්ප ක්‍රමය මත භාණ්ඩ නිපදවයි.

කා සඳහා නිෂ්පාදනය කරනවාද

↓

සාධක වෙළඳපොළ

↓

මිල සංඥා

↓

ගෙවීමේ ශක්තිය පදනම් කරගෙන

↓

ගෙවීමේ ශක්තිය වැඩි අයට භාණ්ඩ වැඩියෙන්ද ගෙවීමේ ශක්තිය අඩු අයට භාණ්ඩ අඩුවෙන්ද භාණ්ඩ ලබා දෙයි

## වෙළෙඳපොළ ක්‍රමයක මිල ඉතා වැදගත් කාර්ය තුනක් ඉටුකරයි. එනම්,

- තොරතුරු හා සංඥා සැපයීමේ කාර්යය
- සානුබල සැපයීමේ කාර්යය
- සලාකනය කිරීමේ කාර්යය

වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක ආර්ථික ඒකකයන්හි හැසිරීම තීරණය කරන මූලික බලවේගය ස්වාර්ථය යි. පරාර්ථය, සමාජ ශුභසාධනය වැනි කරුණු වෙළෙඳපොළ ආර්ථිකයක සැලකිල්ලට නොගැනේ.

වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක පදනම පෞද්ගලික දේපොළ හිමිකම යි. පෞද්ගලික දේපොළ හිමිකම හා බැඳී ඇති නිදහස් ව්‍යවසාය වෙළෙඳපොළ ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණයකි.

# ආර්ථික විද්‍යාව

## පළමු පාඩම Video - 14

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

## විධාන හා නියෝග පදනම් කරගත් ආර්ථික පද්ධති හෙවත් සැලසුම්ගත ආර්ථික පද්ධති

මධ්‍යගත සැලසුම් අධිකාරියක් විසින් දෙනු ලබන නියෝග මගින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳාගනු ලබන අර්ථ ක්‍රමයක් විධාන අර්ථ ක්‍රමයක් ලෙස හැඳින්වෙයි.

මධ්‍යගත සැලැස්මක් යටතේ මෙහෙයවන ආර්ථික පද්ධතියක ලක්ෂණ පහත පරිදි දැක්විය හැකි ය.

- ශ්‍රමය හැර අනෙකුත් නිෂ්පාදන සම්පත්වල හිමිකාරීත්වය රජය සතු වීම
- මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සැලසුම් ක්‍රියාවලිය යොදා ගැනීම
- සමාජ ශුභසාධනය මත කටයුතු කිරීම
- පොදු යහපත ය සඳහා කටයුතු කිරීම

කුමක් කොපමණ, කෙසේ, කා සඳහා නිපදවනවාද යන මූලික ආර්ථික ප්‍රශ්න සඳහා විසඳුම් මධ්‍ය සැලසුම් අධිකාරිය ගනු ලබයි.

## විධාන අර්ථ ක්‍රමයක දුර්වලතා පහත පරිදි දැක්විය හැකි ය.

- සංවිධානය හා සම්බන්ධීකරණය පිළිබඳ ගැටලු
- තත්ත්ව පාලනයේ බිඳ වැටීම්
- සානුබල ප්‍රමාණවත් නොවීම
- පරිසර හායනය

## මිශ්‍ර ආර්ථික පද්ධති

මිශ්‍ර ආර්ථික පද්ධති යනු වෙළෙඳපොළ යාන්ත්‍රණය මගින් සම්පත් බෙදා වෙන් කිරීම හා සැලසුම් ක්‍රියාවලිය මගින් සම්පත් බෙදා වෙන් කිරීම සිදුවන ආර්ථික ක්‍රමය යි.

## මිශ්‍ර ආර්ථිකයක ලක්ෂණ පහත පරිදි දැක්විය හැකි ය.

- ආර්ථිකයේ ප්‍රධාන ක්‍රියාකාරි අංශ වන්නේ පාරිභෝගිකයෝ, නිෂ්පාදකයෝ, නිෂ්පාදන සම්පත් හිමිකරුවෝ හා ආණ්ඩුව යි.

- පෞද්ගලික අංශය අභිප්‍රේරණය කෙරෙන සාධකය ස්වාර්ථය වන අතර පොදු අංශය අභිප්‍රේරණය සාධකය පොදු යහපත ය.

- පෞද්ගලික අංශය හා පොදු අංශය යන දෙක ම නිෂ්පාදන සම්පත් හිමිකරගෙන සිටී.

- සම්පත් බෙදා වෙන් කිරීම පිළිබඳ තීරණ සැලසුම් යාන්ත්‍රණය මගින් සිදු කරයි පෞද්ගලික අංශය මගින් තරගය ක්‍රියාත්මක වේ.

- ආණ්ඩුව ආර්ථිකය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

## මිශ්‍ර ආර්ථික පද්ධති සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

1 සමාජීය වෙළෙඳපොළ ආර්ථික

2 සමාජවාදී වෙළෙඳපොළ ආර්ථික

## සමාජීය වෙළෙඳපොළ ආර්ථික

වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් තුළ සමාජ සාධාරණත්වය ඇති කිරීම සඳහා රජය මැදිහත් වන ආර්ථික සමාජීය වෙළෙඳපොළ ආර්ථික නමින් හැඳින්වේ. එනම් සමාජ සාධාරණත්වය දැඩිව අවධාරණය කෙරෙන ආර්ථික පද්ධති සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයයි.

වෙළෙඳපොළ ආර්ථික පද්ධතියට රජය මැදිහත් වීම පුද්ගල නිදහස සීමා කිරීමටත් වෙළෙඳපොළ යාන්ත්‍රණය කාර්යක්ෂමතාව ගිලිහී යාමටත් හේතු වන බව ලිබරල්වාදීන්ගේ අදහසයි.

ලිබරල්වාදීන්ගේ අදහස ප්‍රතික්ෂේප කරන සමාජයීය වෙළෙඳපොළ ආර්ථික පද්ධතියට පක්ෂ වූවන්ගේ අදහස වන්නේ සමාජ සාධාරණත්වය ඇති කිරීම සඳහා වෙළෙඳපොළ ආර්ථික පද්ධතියට රජය මැදිහත්විය යුතු බවයි.

සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයන්හි නිෂ්පාදන සම්පත් පෞද්ගලික අංශය සතු වුව ද සම්පත් භාවිතය පිළිබඳ විශාල බලපෑමක් රජයෙන් කෙරේ. ආර්ථික, දේශපාලන, සිවිල්, සමාජ, සංස්කෘතික යන මානව හිමිකම් ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී පුළුල් සමාජ ජාල ක්‍රියාත්මක කරයි.

සමාජයීය වෙළෙඳපොළ ආර්ථිකයක පුරවැසියන්ගේ මූලික අයිතීන් අනතුරට ලක් වන හෝ උල්ලංඝනය වන තත්වයන්හි දී ඔවුන්ට ආරක්ෂාවක් රජය විසින් සපයනු ලැබේ.

සේවයේ යෙදී සිටිය දී හට ගන්නා හදිසි අනතුරු, අසනීප තත්වයන් වැනි ආපදා තත්වයන්හි දී සහ වියපත් වීම, දිළිඳු බව, විරැකියාව, දරුවන් හදා වඩා ගැනීම වැනි සමාජීය තත්වයන්හි දී සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයක රජය එහි පුරවැසියන් වෙත සමාජ ආරක්ෂණ ජාලයක් සපයයි.

- රජයේ මෙවැනි සමාජ ආරක්ෂණ ජාල සැපයීම සඳහා අවශ්‍ය අරමුදල් බොහොමයක් සපයා ගන්නේ පුරවැසියන්ගෙන් බදු අය කිරීමෙනි. සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ ශුභසාධනය තමන් වෙත ලැබෙන බැවින් පුරවැසියන් ද රජයට කැමැත්තෙන් බදු ගෙවීම සිදු කරයි.

- සමාජීය වෙළෙඳපොළ ආර්ථික පද්ධති පවතින රටවල් සඳහා නිදසුන් ලෙස නෝර්වේ, ජර්මනිය,ස්වීඩනය, පින්ලන්තය ආදිය දැක්විය හැකි ය.

## සමාජවාදී වෙළෙඳපොළ ආර්ථික

සමාජවාදී වෙළෙඳපොළ ආර්ථික ලෙසින් හැඳින්වෙන්නේ මූලික වශයෙන් සමාජවාදී දර්ශනයන් මත මෙහෙය වෙන කිසියම් දුරකට වෙළෙඳපොළ බලවේගවලට ක්‍රියාත්මක වීමට ඉඩ සලසා ඇති ආර්ථික පද්ධතීන් ය.

සමාජවාදී වෙළෙඳපොළ ආර්ථික සමාජයීය වෙළෙඳපොළ ආර්ථිකවලට වඩා හාත්පසින්ම වෙනස් ය. සමාජවාදී වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක් තුළ නිෂ්පාදන සම්පත් රජය සතු ය. එහෙත් සම්පත් භාවිතය පිළිබඳ තීරණ ගැනීම පෞද්ගලික අංශය සතු ය. එනම් වෙළෙඳපොළ බලවේගවලට අනුව නිෂ්පාදන ආයතනවලට නිෂ්පාදන ප්‍රමාණය හා භාණ්ඩවල මිල තීරණය කිරීමේ අයිතිය පවතී.

සමාජවාදී වෙළෙඳපොළ ආර්ථිකයන් සඳහා නිදසුන් ලෙස චීනය, හංගේරියාව හා බල්ගේරියාව දැක්විය හැකි ය.

## නව සම්ප්‍රදායික ආර්ථික පද්ධති

ආර්ථික පද්ධති සම්බන්ධ නව ප්‍රවණතාවලට නිදසුන් ලෙස නව සම්ප්‍රදායික ආර්ථික පද්ධති දැක්විය හැකි ය.

මෙහිදී ආගමක් හෝ සම්ප්‍රදායික සමාජයක් හෝ පදනම් කර ගනිමින් නව සංස්කෘතික රාමුවකට යොමුවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ.

## ආර්ථික පද්ධතියක කාර්ය සාධනය ඇගයීමේදී නිර්ණායක යොදා ගනී.

- පූර්ණ සේවා නියුක්තිය
- ආර්ථික කාර්යක්ෂමතාව
- ආර්ථික වෘද්ධිය
- මිල ස්ථායිතාව
- සාධාරණ ආදායම් ව්‍යාප්තිය
- බාහිර ස්ථායිතාව
- පාරිසරික ගුණාත්මකභාවය
- ආර්ථික නිදහස

# ආර්ථික විද්‍යාව

## පළමු පාඩම


Video - 15


දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය

යම් දෙන ලද අවස්ථාවක දී ආර්ථිකයක් සතු සියලුම සම්පත් පවත්නා තාක්ෂණය යටතේ උපරිම කාර්යක්ෂමතාවෙන් උපයෝජනය කොට, කිසියම් භාණ්ඩ දෙකකින් නිපදවිය හැකි උපරිම භාණ්ඩ සංයෝග සම්බන්ධ කොට අඳින ලද රේඛාව නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ලෙස හැඳින්වේ.

නිෂ්පාදන ධාරිතා ඉම, නිෂ්පාදන ශක්‍යතා පර්යන්තය, විභව නිෂ්පාදන හැකියා සීමාව යන නම්වලින් ද නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය හඳුන්වනු ලබයි.



# ආර්ථිකයක නිෂ්පාදන හැකියාව තීරණය කරන සාධක පහත පරිදි දැක්විය හැකි ය.

1 සම්පත් සම්භාරය


- භූමිය
- ශ්‍රමය
- ප්‍රාග්ධනය
- ව්‍යවසායකත්වය

2 සාධක ඵලදායිතාව

- තාක්ෂණය
- මානව ප්‍රාග්ධනය
- කළමනාකරණය
- ශ්‍රම විභජනය සහ විශේෂීකරණය


# නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය නිර්මාණය කිරීමේ දී පහත සඳහන් උපකල්පන යොදා ගනී.

- භාණ්ඩ වර්ග දෙකක් පමණක් නිපදවීම
- ආර්ථිකය සතු සම්පත් සම්භාරය ස්ථාවර වීම
- අදාළ කාලය තුළ තාක්ෂණය නොවෙනස් ව පැවතීම
- සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවයෙන් යුක්ත ව උපයෝජනය කිරීම



# නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ බෑවුම

නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මත ගමන් කරන විට එක් භාණ්ඩයක නිෂ්පාදනය නිශ්චිත ප්‍රමාණය බැගින් වැඩි කරන විට අනෙක් භාණ්ඩයෙන් කැප කිරීමට සිදු වන ප්‍රමාණය අතර අනුපාතය, අනුක්‍රමණය හෙවත් බෑවුම ලෙස හැඳින්වේ.




එම බෑවුම මගින් ආන්තික ආවස්ථික පිරිවැය දක්වේ.

## නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක ආන්තික ආවස්ථික පිරිවැය හැසිරෙන ආකාරය අනුව ස්වරූප කිහිපයක් පවතී. එනම්

1. ස්ථාවර ආවස්ථික පිරිවැය
2. වැඩෙන ආවස්ථික පිරිවැය


## ස්ථාවර ආවස්ථික පිරිවැය

නිෂ්පාදන හැකියා මායිමක් මත ගමන් කිරීමේ දී එක් භාණ්ඩ වර්ගයකින් නිශ්චිත ප්‍රමාණය බැගින් වැඩි කිරීමේ දී අනෙක් භාණ්ඩයෙන් කැප කරන ප්‍රමාණය නොවෙනස් ව පවතින තත්ත්වයක් ස්ථාවර ආවස්ථික පිරිවැය වශයෙන් හඳුන්වයි.

| පාරිභෝජන භාණ්ඩ | ප්‍රාග්ධන භාණ්ඩ | |
|---|---|---|
| 0 | 20 | |
| 2 | 16 | 4 |
| 4 | 12 | 4 |
| 6 | 8 | 4 |
| 8 | 4 | 4 |
| 10 | 0 | 4 |

මෙවැනි ස්ථාවර ආවස්ථික පිරිවැයකින් යුතු නිෂ්පාදන හැකියා මායිම සරල රේඛීය ස්වභාවයක් ගනී. මෙය පහත ආකාරයට පෙන්නුම් කෙරේ.

| පාරිභෝජන භාණ්ඩ | ප්‍රාග්ධන භාණ්ඩ |
|---|---|
| 0 | 20 |
| 2 | 16 |
| 4 | 12 |
| 6 | 8 |
| 8 | 4 |
| 10 | 0 |




කුෂාන් වීරහැන්නැදිගේ

| පාරිභෝජන භාණ්ඩ X | ප්‍රාග්ධන භාණ්ඩ Y | පාරිභෝජන භාණ්ඩ වල ආන්තික ආවස්ථික පිරිවැය X ආ.පි = $\frac{\Delta Y}{\Delta X}$ | ප්‍රාග්ධන භාණ්ඩ වල ආන්තික ආවස්ථික පිරිවැය Y ආ.පි = $\frac{\Delta X}{\Delta Y}$ |
|---|---|---|---|
| 0 | 20 | - | 0.5 |
| 2 | 16 | 2 | 0.5 |
| 4 | 12 | 2 | 0.5 |
| 6 | 8 | 2 | 0.5 |
| 8 | 4 | 2 | 0.5 |
| 10 | 0 | 2 | - |

# ආර්ථික විද්‍යාව

## පලමු පාඩම

Video - 16

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)


# වැඩෙන ආවස්ථික පිරිවැය

නිෂ්පාදන හැකියා මායිම මත ගමන් කිරීමේ දී කිසියම් භාණ්ඩ වර්ගයක නිශ්චිත ප්‍රමාණය බැගින් වැඩි කරන විට අනෙක් භාණ්ඩයෙන් කැප කරන ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වන තත්ත්වයක් වැඩෙන ආවස්ථික පිරිවැය වශයෙන් හඳුන්වයි.

මෙවැනි වැඩෙන ආවස්ථික පිරිවැයකින් යුතු නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයමූලයට අවතල හැඩයක් ගනියි.

| පාරිභෝජන භාණ්ඩ | ප්‍රාග්ධන භාණ්ඩ | |
|---|---|---|
| 0 | 20 | |
| 2 | 18 | 2 |
| 4 | 15 | 3 |
| 6 | 11 | 4 |
| 8 | 6 | 5 |
| 10 | 0 | 6 |

මෙවැනි වැඩෙන ආවස්ථික පිරිවැයකින් යුතු නිෂ්පාදන හැකියා මායිම මූලයට අවතල ස්වභාවයක් ගනී. මෙය පහත ආකාරයට පෙන්නුම් කෙරේ.




කුෂාන් වීරහැන්නැදිගේ

| පාරිභෝජන භාණ්ඩ X | ප්‍රාග්ධන භාණ්ඩ Y | පාරිභෝජන භාණ්ඩ වල ආන්තික ආවස්ථික පිරිවැය X ආ.පි = $\frac{\Delta Y}{\Delta X}$ | ප්‍රාග්ධන භාණ්ඩ වල ආන්තික ආවස්ථික පිරිවැය Y ආ.පි = $\frac{\Delta X}{\Delta Y}$ |
|---|---|---|---|
| 0 | 20 | - | 1 |
| 2 | 18 | 1 | 0.66 |
| 4 | 15 | 1.5 | 0.5 |
| 6 | 11 | 2 | 0.4 |
| 8 | 6 | 2.5 | 0.33 |
| 10 | 0 | 3 | - |

ස්ථාවර ආවස්ථික පිරිවැය හා වැඩෙන ආවස්ථික පිරිවැය ඇති වීම කෙරෙහි බලපාන සාධක පහත පරිදි දැක්විය හැකි ය.

## ස්ථාවර ආවස්ථික පිරිවැය ඇති වීමට හේතු

- සම්පත් සමජාතීය වීම
- එක් නිෂ්පාදනයක් සඳහා කාර්යක්ෂම වන සම්පත් අනෙක් නිෂ්පාදනය සඳහා කාර්යක්ෂම වීම
- නිෂ්පාදන ක්‍රම ශිල්ප සමානවීම

## වැඩෙන ආවස්ථික පිරිවැය ඇති වීමට හේතු

- සම්පත් සමජාතීය නොවීම
- එක් නිෂ්පාදනයක් සඳහා කාර්යක්ෂම වන සම්පත් අනෙක් නිෂ්පාදනය සඳහා කාර්යක්ෂම නොවීම
- නිෂ්පාදන ක්‍රම ශිල්ප සමානනොවීම

- ඉහත සඳහන් ආවස්ථික පිරිවැය තත්ත්වයන් අතරින් වඩාත් තාත්ත්වික බව, පෙන්නුම් කරනුයේ වැඩෙන ආවස්ථික පිරිවැය යි.

- මේ නිසා විවිධ ආර්ථික විග්‍රහයන් පැහැදිලි කිරීම සඳහා වැඩෙන ආවස්ථික පිරිවැය යොදා ගනියි.

# ආර්ථික විද්‍යාව

## පළමු පාඩම Video - 17


දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

ආර්ථික විද්‍යාවේ සූක්ෂ්ම ආර්ථික විද්‍යා සංකල්ප සහ සාර්ව ආර්ථික විද්‍යා සංකල්ප නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇසුරින් නිරූපණය කළ හැකිය.

සූක්ෂ්ම ආර්ථික විද්‍යා සංකල්පවලට නිදසුන් කිහිපයක් පහත සඳහන් වේ.


- හිඟකම
- විකල්ප ප්‍රයෝජන
- තේරීම
- ආවස්ථික පිරිවැය
- නිෂ්පාදන කාර්යක්ෂමතාව
- සම්පත් බෙදා වෙන් කිරීමේ කාරයක්ෂමතාව

# හිඟකම





ඉහත දක්වා ඇති ප්‍රස්තාරයට අනුව **A** ලක්ෂයෙන් පෙන්නුම් කරන භාණ්ඩ සංයෝගය නිපදවීමට ආර්ථිකයේ පවතින සම්පත් ප්‍රමාණවත් නොවන බැවින් **A** ලක්ෂ්‍යයෙන් හිඟකම පෙන්නුම් කරයි.

# විකල්ප ප්‍රයෝජන




**ඉහත නිෂ්පාදන හැකියා මායිම තුළ විකල්ප නිමැවුම් සංයෝග රාශියක් පවතී.**
**A ,B ,C ,D ,E ලක්ෂ්‍යවලින් එම සංයෝග පෙන්වයි.**


# තේරීම




**ආර්ථිකයක් එම සංයෝග අතරින් එක් සංයෝගයක් තෝරා ගත යුතුවේ. ඉහත රූපයට අනුව A ,B ,C ,D ,E සංයෝගයන්ගෙන් එක් සංයෝගයක් තෝරා ගැනීමට සිදු වේ.**

# ආවස්ථික පිරිවැය


කිසියම් ආර්ථික කටයුත්තකදී හිඟ සම්පත් අතරින් තේරීම් කරන විට ඒවෙනුවෙන් අත්හරිනු ලබන ඊළඟ හොඳ ම විකල්ප අවස්ථාව ආවස්ථික පිරිවැය වශයෙන් හඳුන්වනු ලබයි.




මෙම ආර්ථිකය C භාණ්ඩ සංයෝගය තෝරා ගතහොත්

පාරිභෝගික භාණ්ඩ 100 වෙනුවෙන් ආවස්ථික පිරිවැය ප්‍රාග්ධන භාණ්ඩ 100ක් වේ

ප්‍රාග්ධන භාණ්ඩ 200 සඳහා ආවස්ථික පිරිවැය පාරිභෝගික භාණ්ඩ 300කි.




**එම ආර්ථිකයේ C සිට B දක්වා ගමන් කිරීමට තීරණය කළහොත් ඉහළ දැමූ ප්‍රාග්ධන භාණ්ඩ 50 වෙනුවෙන් ආවස්ථික පිරිවැය පාරිභෝගික භාණ්ඩ ඒකක 30 වන අතර**

**B සිට C දක්වා ගමන් කිරීමට තීරණය කළහොත් ඉහළ දැමූ පාරිභෝගික භාණ්ඩ 30 වෙනුවෙන් ආවස්ථික පිරිවැය ප්‍රාග්ධන භාණ්ඩ ඒකක 50කි.**


# නිෂ්පාදන කාර්යක්ෂමතාව

නිෂ්පාදන කාර්යක්ෂමතාව යනු, ආර්ථිකයක සියලු සම්පත්වලින් වැඩි ම ඵලදායිතාවක් ලබාගත හැකි වීම යි.

මෙය නිෂ්පාදන හැකියා මායිම මත පිහිටි ලක්ෂ්‍යය මගින්පෙන්විය හැකිවේ.

මේ සඳහා අවශ්‍ය ප්‍රධාන කොන්දේසි 2 වනුයේ,

- පූර්ණ සේවා නියුක්තිය
- පූර්ණ නිෂ්පාදනයයි.



# සම්පත් බෙදා වෙන් කීරීමේ කාරයක්ෂමතාව

සම්පත් බෙදා වෙන් කීරීමේ කාර්යක්ෂමතාව යනු, ආර්ථිකයේ පවතින සීමිත සම්පත් සමාජවරණයට ගැළැපෙන ආකාරයට බෙදා වෙන් කිරීම වේ.

මෙහි දී ඉටුවිය යුතු කොන්දේසිය වනුයේ, ආන්තික ප්‍රතිලාභය ආන්තික පිරිවැයට සමාන වීම (MC=MB)වේ.

කිසියම් භාණ්ඩයකින් අතිරේක ඒකකයක් පරිභොජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභය ආන්තික ප්‍රතිලාභය (MB) යි. එය භාණ්ඩය සඳහා පාරිභෝගිකයා ගෙවීමට කැමති උපරිම මිල වේ. එම නිසා ආන්තික ප්‍රතිලාභය (MB) මිලට (P) සමාන වේ.


කිසියම් භාණ්ඩයක නිමැවුම එක් ඒකකයකින් වැඩි කරනවිට මුළු පිරිවැයට අලුතෙනි එකතුවන ප්‍රමාණය ආන්තික පිරිවැය(MC) වේ.

- මෙම නිසා සම්පත් බෙදා වෙන් කීරීමේ කාර්යක්ෂමතාව දී ඉටුවිය යුතු කොන්දේසිය වනුයේ, MC=MB=P වේ. මෙම කොන්දේසිය ඉටු වන්නේ නිෂ්පාදන හැකියා මායිමෙහි එක් ලක්ෂ්‍යයක දී පමණි.

# ආර්ථික කාර්යක්ෂමතාව

**සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව හා නිෂ්පාදන කාර්යක්ෂමතාව යන දෙකෙහි ම එකතුව ආර්ථික කාර්යක්ෂමතාව වේ.**

**මෙය පහත ප්‍රස්තාර සටහනින් පෙන්නුම් කරයි.**




**සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව හා නිෂ්පාදන කාර්යක්ෂමතාව යන දෙකෙහි ම එකතුව**

# ආර්ථික විද්‍යාව

## පළමු පාඩම Video - 18


දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

## සාර්ව ආර්ථික විද්‍යා සංකල්පවලට නිදසුන් කිහිපයක් පහත සඳහන් වේ.

- පූර්ණ සේවා නියුක්තිය
- ඌන සම්පත් උපයෝජනය
- ආර්ථික පසු බැසීම
- ආර්ථික අවපාතය
- ආර්ථික වර්ධනය
- වර්තමාන පරිභෝජනය හා අනාගත පරිභෝජනය අතර සම්පත් බෙදාහැරීම
- ආර්ථික බිඳ වැටීම

# පූර්ණ සේවා නියුක්තිය

ආර්ථිකයක පවත්නා සියලු ම සම්පත් ඵලදායී ලෙස නිෂ්පාදනය ක්‍රියාවලියක සේවා නියුක්ත කරවීම පූර්ණ සේවා නියුක්තිය ලෙස හඳුන්වයි. පූර්ණ සේවා නියුක්තිය නිෂ්පාදන හැකියා මායිම මත පිහිටි ලක්ෂයකින් පෙන්නුම් කරයි පහත පරිදි පෙන්විය හැකි ය.



# ඌන සම්පත් උපයෝජනය


## 01. ඌන සේවා නියුක්තිය

ඌන සේවා නියුක්තිය යනු සම්පත් උපරිම ඵලදායිතාවක් නොලැබෙන ආකාරයෙන් සම්පත් සේවා නියුක්ත කරවීම වේ.

නිදසුන :-උපාධිධාරියෙක් කළමනාකරණ සේවයේ රැකියාවක නිරත වීම

## 02 සේවා වියුක්තිය


සිවිල් අරගල, නියඟ හා වෙනත් හේතු මත නිෂ්පාදන සම්පත් භාවිත නොකිරීම




B ලක්ෂයෙන් පෙන්නුම් කරනුයේ ඌන සේවා නියුක්ති තත්ත්වය හා සේවා වියුක්ති තත්වය ය.

# ආර්ථික පසු බැසීම


ආර්ථික පසුබැසීම යනු භාණ්ඩ හා සේවා සඳහා ආර්ථිකයේ ඉල්ලුම අඩුවීම හේතුවෙන් නිෂ්පාදනය පහළ යාම ආර්ථික පසු බැසීමකි. ආර්ථික පසු බැසීම කෙටි කාලීන තත්ත්වයක් වන අතර පසු බැසීම් තත්ත්වය හේතුවෙන් සේවා වියුක්ති තත්ත්වය ඉහළ යයි.





ප්‍රස්තාර සටහනට අනුව **A** ලක්ෂයේ සිට **B** ලක්ෂ්‍යය දක්වා මායිම් වක්‍රය තුළට ගමන් කිරීමෙන් මෙය පෙන්නුම් කළ හැකි ය.

# ආර්ථික අවපාතය

ආර්ථික පසුබැසීමක දිගු කාලීන තත්ත්වය ආර්ථික අවපාතයක් වශයෙන් හඳුන්වයි. මෙහි දී සේවා වියුක්ත ව පවතින සම්පත් විනාශ වීමකට භාජනය විය හැකි බැවින් ආර්ථිකයේ සම්පත් සම්භාරය අඩු වී නිෂ්පාදන හැකියා මායිම වමට විතැන් වේ. ආර්ථික අවපාතයේ කෙටි කාලීන තත්ත්වයකදී එනම්, සම්පත් විනාශ වීමකට භාජනය වී නොතිබුණහොත් ලක්ෂ්‍යයකින් ද වමට විතැන් විය හැකි ය.








සම්පත් විනාශවීමකින් තොරවූ ආර්ථික අවපාත තත්ත්වයක් ඉහත පළමුවන ප්‍රස්තාර සටහනේ A සිට B දක්වා ලක්ෂ්‍යයකින් විතැන් වීම මගින් පෙන්නුම් කරයි.

ඉහත දෙවන ප්‍රස්තාරයෙන් ආර්ථික අවපාත තත්ත්වයක් පෙන්වන අතර එහි දි සම්පත් විනාශ වීමකට ලක්වී ඇති බැවින් වක්‍රය වමට විතැන් වේ.


# ආර්ථික වර්ධනය

ආර්ථික වර්ධනය යනු ආර්ථිකයක මූර්ත නිෂ්පාදනය අඛණ්ඩව දිගු කාලයක් ඉහළ යාමය. ආර්ථික වර්ධනයේ දී නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන්වේ. මෙය පහත ප්‍රස්තාර සටහනින් පෙන්නුම් පෙන්නුම් කරයි.




# ආංශික වෘද්ධය

තාක්ෂණය දියුණු වීම වැනි කිසියම් හේතුවක් නිසා එක් භාණ්ඩ වර්ගයක පමණක් සිදුවන නිමැවුමේ ඉහළ යාම ආංශික වෘද්ධයකි. එය කිසියම් ආකාරයට අසමතුලිත වෘද්ධයකි. මෙය පහත ප්‍රස්තාර සටහනින් පෙන්නුම් කරයි.




කුෂාන් වීරහැන්නැදිගේ


# වර්තමාන පරිභෝජනය හා අනාගත පරිභෝජනය අතර සම්පත් බෙදාහැරීම


වර්තමානයේ ආර්ථිකය තම හිඟ සම්පත් භාවිත කරන ආකාරය මත, එම ආර්ථිකයට උරුම වන අනාගත සම්පත් සම්භාරය තීරණය වනු ඇත.

වර්තමානයේ දි ඉහළ සම්පත් ප්‍රමාණයක් පරිභෝජනය සඳහා කැප කළහොත් අනාගතයේ දී ආර්ථිකයේ වර්තමානයේ ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය අඩු වනු ඇත.

එලෙස ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය අඩු වීම හේතුවෙන් අනාගත නිෂ්පාදන හැකියාව පහළ වැටෙන අතර ආර්ථික වෘද්ධියට එය බාධාවක් වේ.

මේ අනුව වර්තමානයේ පරිභෝජනය හා අනාගත පරිභෝජනය අතර සම්පත් වෙන් කරන ආකාරය, ආර්ථික වෘද්ධිය තීරණය කරන වැදගත් සාධකයකි.




ඉහත පළමු වන ප්‍රස්තාරයට අනුව එම ආර්ථිකය වැඩි සම්පත් ප්‍රමාණයක් පරිභෝජනය සඳහා යොදවා ඇති බැවින් ආර්ථික වෘද්ධි අනුපාතය පහළ අගයක් ගෙන ඇත.

ඉහත දෙවන ප්‍රස්තාරයට අනුව එම ආර්ථිකය පරිභෝජනයට වඩා ඉහළ සම්පත් ප්‍රමාණයක් ප්‍රාග්ධන භාණ්ඩ පරිභෝජනය සඳහා යොදවා ඇති බැවින් ආර්ථික වෘද්ධි අනුපාතය ඉහළ අගයක් ගෙන ඇත.

වර්තමාන පරිභෝජනය කැප කිරීමට එතරම් හැකියාවක් නොමැති කිසියම් රටකට විදේශීය රටවලින් ප්‍රාග්ධනය තම රටට ගෙන්වා ගත හැකි නම් (නිදසුන්:- විදේශාධාර, විදේශ ආයෝජන) වර්තමාන පරිභෝජන සීමා නොකොට ආයෝජනය වැඩි කිරීම මගින් වේගවත් ආර්ථික වෘද්ධියක් කරා ළඟා විය හැකි ය.

# රටක නිෂ්පාදන ධාරිතාව වෙනස් වීමට බලපාන ප්‍රධාන සාධක දෙකකි.

- සම්පත් සම්භාරය වෙනස් වීම

- ඵලදායිතාව වෙනස් වීම

ආර්ථිකයේ සම්පත් සම්භාරය හා ඵලදායිතාව වෙනස් වීම හේතුවෙන් එම ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව නැතහොත් නිෂ්පාදන හැකියාව වෙනස් වේ.

ආර්ථිකයක සම්පත් සම්භාරය වෙනස් වීම ආකාර දෙකකින් සිදු විය හැකි ය.

- සම්පත් සම්භාරය වැඩි වීම

- සම්පත් සම්භාරය අඩු වීම යි.

# සම්පත් සම්භාරය වැඩි වීම

**සම්පත් සම්භාරය වැඩි වීම හේතුවෙන් ආර්ථිකයේ නිෂ්පාදන හැකියාව වැඩි වී නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන් වේ.**

**නිදසුන්:-**


**නව සම්පත් සොයා ගැනීම**

**සම්පත් සඳහා නව හිමිකාරිත්වයක් ලැබීම**

**විදේශ රටවලින් සම්පත් ගලා ඒම**

**නව තාක්ෂණ ක්‍රම මගින් සම්පත් ප්‍රමාණය වැඩි කර ගැනීම**

**විදේශ ණය හා ආධාර හා ආයෝජන ඉහළ යාම.**



# සම්පත් සම්භාරය අඩු වීම යි.


ආර්ථිකයක සම්පත් සම්භාරය අඩු වීම මගින් නිෂ්පාදන හැකියාව අඩු වන අතර නිෂ්පාදන හැකියා මායිම වමට විතැන් වේ.

නිදසුන්:-

යුද්ධ කටයුතු හේතුවෙන් සම්පත් විනාශ වීම,

ස්වාභාවික විපත් (සුනාමි, ගං වතුර උවදුරු, නාය යෑම් ආදිය)


විදේශ ආයෝජන අඩු වීම




# ඵලදායිතාවය ඉහළ යාම

ආර්ථිකයක සම්පත්වල ඵලදායිතාවය ඉහළ යාම මගින් එම ආර්ථිකයේ නිෂ්පාදන හැකියාව ඉහළ ගොස් නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන් වේ.

නිදසුන්:- තාක්ෂණික දියුණුව, නව ශිල්ප ක්‍රම , රජය මගින් ශ්‍රමිකයන් පුහුණු කිරීම.





ඵලදායිතාව වැඩි වීම එක් අංශයක පමණක් සිදු වුවහොත් නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන් වනුයේ එම අක්ෂයෙන් පමණි.



# ඵලදායිතාව අඩු වීම

ආර්ථිකයක සම්පත්වල ඵලදායිතාව අඩු වීම මගින් එම ආර්ථිකයේ නිෂ්පාදන හැකියාව පහළ ගොස් නිෂ්පාදන හැකියා මායිම වමට විතැන් වේ.

නිදසුන්:- පුහුණු ශ්‍රමිකයන් රටින් බැහැර වීම, පැරණි ශිල්ප ක්‍රම භාවිතය




ඵලදායිතාව අඩු වීම එක් අංශයක පමණක් සිදු වුවහොත් නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන් වනුයේ එම අක්ෂයෙන් පමණි.

